# ප්‍රජා අධ්‍යාපනයෙහි ලා අධ්‍යාපන ආයතන සතු කාර්ය භාරය පිළිබඳ විමසීමක්

ඩී. එස්. ඒ. ඉන්ද්‍රපාල

ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්ව විද්‍යාලයෙහි
අධ්‍යාපන පති උපාධි පරීක්ෂණය සඳහා
ඉදිරිපත් කරන ලද
පර්යේෂණ නිබන්ධය යි.

1971

122809

## පෙර වදන

මෙම පර්යේෂණ නිබන්ධය ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්ව විද්‍යාලයෙහි අධ්‍යාපන පති උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කෙරෙන්නකි. එයට පසු බිම් වී ඇත්තේ ප්‍රජා අධ්‍යාපන ක්ෂෙත්‍රයයි.

ප්‍රජා අධ්‍යාපනය යනු නව විෂයයක් නොවේ. එහෙත් ලංකාවේ ඒ පිළිබඳව දක්වන උනන්දුව ප්‍රමාණවත් නොවන නමුත්, සංවර්ධනය වන රටක් වශයෙන් උක්ත ක්ෂෙත්‍රය තුළින් මෙරටට ලද හැකි ආභාසය ඉමහත් බව ලෝකයේ සංවර්ධනය වී ඇති රටවල් දීර්ඝ කාලයක් මුවල්ලෙහි ඒ සම්බන්ධයෙන් දක්වා ඇති අඛණ්ඩ අවධානය පිළිබඳව විමසීමේ දී හෙළි වේ.

ඒ අනුව විශේෂයෙන්ම විධිමත් අධ්‍යාපනයෙන් අනතුරුව ප්‍රජාවට නොකඩවා අධ්‍යාපනයක් ලැබීමට අවස්ථා සලසා දීම සඳහා මෙරට අධ්‍යාපන ආයතන කොතෙක් දුරට ඉවහල් කර ගත හැකි දැයි යනු විමසීමත් ඒ සඳහා එම ආයතන තුළින් දියත් කළ හැකි විවිධ අධ්‍යාපනික ව්‍යාපාර පිළිබඳව සලකා බැලීමත් ප්‍රධාන වශයෙන් මෙම පර්යේෂණයෙහි අරමුණ වූයේය.

මෙහි දී, ලෝකයේ සංවර්ධිත රටවල් මෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ද ප්‍රජා සංවර්ධනය සඳහා ප්‍රජා අධ්‍යාපන ක්ෂෙත්‍රය උපයෝගී කර ගත් හා කර ගන්නා ආකාරය ද තුලනාත්මකව විමසීමට භාජනය කොට ඇත්තේ එමගින් කිසියම් ආභාසයක් මෙරටට ද ලැබිය හැකි හෙයිනි.

මේ හිසින්ම ලියැවුණු ග්‍රන්ථයක් තවමත් ලංකාවෙහි පළ වී නැත. විටින් විට ඇතැම් විද්වතුන් විසින් ඊට අදාල සමහරක් කරුණු සාකච්ඡාවට භාජනය කර ඇති අතර ඒ සියල්ලක්ම පාහේ මූලාශ්‍ර වශයෙන් සලකා ප්‍රයෝජනයට ගත් බව සඳහන් කළ යුතුය. එමෙන්ම වෘද්ධ, සමාජ, අඛණ්ඩ, යාවජීව, පාසලින් බාහිර වැනි අධ්‍යාපන ක්ෂෙත්‍රයන්

පිළිබඳව විවිධ රටවල ලියැවී ඇති නොයෙක් ග්‍රන්ථ ද පරිශීලනය කොට ඒවා ද අවශ්‍ය තන්හි මූලාශ්‍ර වශයෙන් ප්‍රයෝජනයට ගැනිණි. ඒ හැරෙන්නට එක්සත් ජාතීන් ගේ අධ්‍යාපනික විද්‍යාත්මක සහ සංස්කෘතික ආයතනය සහ රට අනුබද්ධිත විවිධ සංවිධාන මගින් පළ කොට ඇති වාර්තා සහ නොයෙක් ග්‍රන්ථ ද මෙම පර්යේෂණයට අදාල දත්ත ගවේෂණය කිරීමේ දී බෙහෙවින් ඉවහල් විය.

මගේ අධ්‍යාපනික කටයුතු සාර්ථක ලෙස කර ගෙන යාම සඳහා කවදත් මට අතුපීලව අත දෙන ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයෙහි විද්‍යෝදය මණ්ඩපයේ කලා පීඨාධිපති මහාචාර්ය එල්. පී. ගේවගේ මහතා මගේ උපදේශක වරයා වශයෙන් ක්‍රියා කළ අතර, එතුමා මෙහි ලා මට දුන් ආධාරෝපකාර වචනයෙන් විස්තර කළ නොහැකි තරම්ය. මෙම පර්යේෂණ නිබන්ධයෙන් ලාංකික ප්‍රජාවගේ ප්‍රගතියට කිසියම් ආධාරයක් ලැබේ නම් එහි ගෞරවය මුළුමනින්ම මහාචාර්ය ගේවගේ මහතාට හිමි විය යුතු බව කෘතඥතා පූර්වකව සඳහන් කළ යුතුය. මෙහි ලා විවිධ අන්දමින් ආධාර කළ තවත් බොහෝ දෙනෙකි. ඒ සැම කෙනකුම මෙහි දී නම් වශයෙන් සඳහන් කළ නොහැකි නමුත් ඒ සියලුම දෙනා මගේ අවංක භක්ත්‍යාදරයට හිමිකරුවෝ වෙති.

ඩී. එස්. ඩී. ඉන්ද්‍රපාල.

# පටුන


| | |
|---|---|
| පෙර වදන | v - vi |
| සංකේත | vii - xii |
| පළමුවන පරිච්ඡේදය - ප්‍රජා අධ්‍යාපනය පිළිබඳ අර්ථසීමන සහ එහි විෂය සීමාව | 1 - 54 |
| දෙවන පරිච්ඡේදය - ප්‍රජා අධ්‍යාපනයේ පරමාර්ථ අරමුණු සහ ආවශ්‍යකත්වය | 55 - 82 |
| තුන්වන පරිච්ඡේදය - ප්‍රජා අධ්‍යාපනයේ දාර්ශනික පදනම | 83 -112 |
| සිව්වන පරිච්ඡේදය - ප්‍රජා අධ්‍යාපනයෙහි ලා පාසල සතු කාර්ය භාරය | 113 -162 |
| පස්වන පරිච්ඡේදය - ප්‍රජා අධ්‍යාපනයෙහි ලා ගුරු විද්‍යාල සතු කාර්ය භාරය | 163 -199 |
| සයවන පරිච්ඡේදය - ප්‍රජා අධ්‍යාපනයෙහි ලා විශ්ව විද්‍යාල සතු කාර්ය භාරය | 200 -238 |
| සත්වන පරිච්ඡේදය - ප්‍රජා අධ්‍යාපනයෙහි ලා පිරිවෙන් සහ විහාරාරාම සතු කාර්ය භාරය | 239 -268 |
| අටවන පරිච්ඡේදය - ප්‍රජා අධ්‍යාපන තර්කන ශිල්ප ධර්ම සහ ක්‍රම | 269 -319 |
| නවවන පරිච්ඡේදය - යුනෙස්කෝ ප්‍රජා අධ්‍යාපන සේවාව | 320 -347 |
| දසවන පරිච්ඡේදය - නිගමන යෝජනා සහ දුෂ්කරතා | 348 -362 |
| ග්‍රන්ථ නාමාවලිය = | *363 -370* |